# කරුණාවන්ත බිංදු



රශිනි විමර්ශා රත්නායක

# කරුණාවන්ත බිංදු

## රශිනි විමර්ශා රත්නායක

© කතෘ ප්‍රකාශනයකි.
2023.11.15
ISBN 978-624-206-783-4

# පිදුම

මට අකුරු කියා දුන්

චාමිනී පල්ලියගුරු

ගුරුතුමියට

ආදරයෙන් පුදමි !



# පෙරවදන

වත්මන් අධ්‍යාපනයෙන් ඵලදායි පුරවැසියෙකු සතුටින් ජීවත්වන පවුලක් මෙන්ම ප්‍රඥාසම්පන්න දැනුමෙන් යුත් බහු විධ කුසලතාවන්ගෙන් සපිරි පුරවැසියන් සහිත සමාජයක් ගොඩ නැගීම අපේක්ෂාවයි. එසේ නම් පාසලට වගකීම් පවරන දරුවාගේ විභවතා හඳුනාගෙන ඒවා ඔපවත් කිරීම තුළ ගොඩනැගී ඇති පොත් ලිවීමේ සංස්කෘතිය මෙවර ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් දරුවනට ගැළපෙන "දිවිය දිනන විද්‍යුත් පොතක්" ව්‍යාපෘතිය එක් වූ පුංචි ලේඛක ලේඛිකාවන්ට මෙම කෘතිය තුළ විදුහල්පතිවරුන්, ගුරුභවතුන් මෙන් ම නන් අයුරින් උදව් උපකාර කළ සැමට හෘදයාංගම ස්තූතිය මෙමගින් පිරිනමමි. මෙම ව්‍යාපෘති යෝජනාව ඉදිරිපත්කරමින් එයට ජීවයක් වූ සෙනෙවිරත්න මහලේකම්ගේ සේවය ද අගයමි.

ශෂිකලා සේනාධීර (විදුහල්පතිනිය)

මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර

2023. 10.20

බිංදු පොඩි ළමයෙක්.
එයා ඉගෙන ගන්නේ
දෙක වසරේ.



එයා හරිම
කරුණාවන්තයි.
ඒ නිසා හැමෝම බින්දුට
ගොඩක් ආදරෙයි.



බිංදු ඉස්කෝලේ යන පාර
අයිනේ ඇළක් තිබුණා.
ඒ ඇළේ ලස්සන මාළුවෝ
ගොඩාක් හිටියා.



බිංදු උදේට ඉස්කෝලේ යද්දී මාළුවන්ට කන්න දෙන්න මොනවාහරි අරගෙන යනවා.

බිංදු පාරේ ඉන්න බලු පැටවුන්ට කන්න දෙන්නත් මොනවාහරි අරගෙන යන්න අමතක කළේ නැහැ.

දවසක් හැන්දෑවේ බිංදු ඇළ ඉවුරේ ඇවිදින්න ගියා.

පාල මාමා මාළු බානවා බිංදු දැක්කා.



බිංදුට ගොඩාක් දුක හිතුණා.

එයා ඉක්මනින්ම පාල මාමා ළඟට ගියා.



"පාල මාමේ, ඇයි මාළුවෝ බිලී කොක්කේ එල්ලෙන්නේ?" බිංදු ඇහුවා.



"මේකට පණුවෙක්ව
අමුණලා තියෙන්නේ.
මාළුවා පණුවාව කන්න
යද්දී කොක්කට
අහුවෙනවා. එතකොට
මම මාළුවාව උඩට ඇදලා
ගන්නවා."


පාල මාමා කිව්වා.

"අනේ ඒක නම් හරිම පව්
වැඩක්, රස කෑම
පෙන්නලා මාමාටත්
එහෙම කරනවාට මාමා
කැමති ද?"
බිංදු ඇහුවා. පාල මාමා
පුදුම වෙලා වගේ බැලුවා.
ටිකක් කල්පනා කරා.



"පුතා කියන එක ඇත්ත
තමයි. මම ආයෙත්
කවමදාවත් සත්තු
මරන්නේ නැහැ"
පාල මාමා කිව්වා.

මාළු යාළුවන්ගේ ජීවිත බේරාගත්ත නිසා බිංදූට හරිම සතුටුයි.



බිංදූ සතුටින් ගෙදර ගියා.

නිමි.

# පසුවදන



නූතන තාක්ෂණික මෙවලම් භාවිතයට එකතුවීමත් සමග සිදුවන සමාජ ආර්ථික පරිවර්තනයන් හේතුකොටගෙන පොත පතින් දුරස්වන පාසල් දරුවන් නැවත පොත පතට සමීප කරවීම හරහා අධ්‍යාපනයේ ගුණාත්මක වර්ධනයක් ඇතිකිරීම ඔවුන්ගේ සාහිත්‍යය නිර්මාණ හැකියාවන් ඔප්නැංවීම තුළින් රටේ සාහිත්‍ය ප්‍රබෝධයක් ඇති කිරීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ දී මා විසින් අධ්‍යාපන අමාත්‍යාංශයට පෞද්ගලික යෝජනාවක් ලෙස පාසල් දරුවන් ග්‍රන්ථ කරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදි. ඒ යටතේ වැඩිම ග්‍රන්ථ ප්‍රමාණයක් රචනා කරමින් වාර්තාවක් තබන්නේ මහාමායා පුංචි ගත්කතුවරියන්ය. පාසල තුළ ගොඩනැගී ඇති ලේඛන සංස්කෘතිය නව මාවතකට යොමු කරමින් රටේ සෙසු පාසල් දරුවන් හා එක්ව මෙවර ජාත්‍යන්තර පාඨකයන් වෙත ලඟාවීමට නූතන තාක්ෂණය හා බැඳුනු විද්‍යුත් කෘති රචනා කරන්නට විය. ඒ තුළින් සම්පාදනය වූ මෙම විද්‍යුත් කෘතිය දරුවන්ට අත්දැකීම් සමුදායක් ලබාදෙමින් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවට ඉවහල්වන අතරම ඔවුන්ගේ හැඟීම් දැනීම් නිර්මාණාත්මක හැකියාවන් ශාස්ත්‍රීය හික්මීම ප්‍රදර්ශනය කරන කැඩපතකි. මෙම නිර්මාණ රටේ අධ්‍යාපනයේ දිශානතිය මෙන්ම සමාජ ප්‍රගමනයට මගපෙන්වන නිසා ප්‍රතිපත්ති සම්පාදකයින් සහ සැළසුම්කරුවන්ට මෙන්ම සමාජයේ වගකිවයුතු පාර්ශවයන්ට ආලෝකයක් සපයයි. පාසල් මට්ටමින් ආරම්භ කර ජාතක තලය දක්වා විවිධ අභියෝග මැද සංකල්ප මංකොල්ලයන්ට හසුවෙමින් පැමිණි මෙම ව්‍යාපෘතියේ ජීවය වූයේ මහාමායා දියණියන් සහ පාසල් ප්‍රජාව බව ගෞරවයෙන් සිහිපත් කරමි. "දිවිය දිනන විද්‍යුත් පොතක්" ව්‍යාපෘතියට මහාමායා දියණියන් සමග එක්ව විද්‍යුත් කෘතියක් රචනා කර ජනගත කරන්නට ඩිජිටල් වේදිකාවට පිවිසි ගත්කතු අංකුර ඔබට ලෝකය දිනන ගත්කතුවරයෙකු වීමට ශක්තිය ලැබේවායි පතමු!

මෙයට,

සෙනෙවිරත්න මහලේකම්

පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකළ ව්‍යාපෘතියේ නිර්මාතෘ

2023-10-20

ISBN 978-624-206-783-4